# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | දිනය<br>திக<br>Date |
| 1609 / 2024 | / 2024 | 22/10 /2024<br>පැය 0530 |

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට – තලංගම පොලිස් ස්ථානය.**

2024.10.21 වන දින උදෑසන කාලයේ තලංගම පොලිස් වසමේ තලාහේන හන්දිය හා බත්තරමුල්ල යන ප්‍රදේශ වලදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 100 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 600 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 31 හා 32 වයස්වල පසුවන මුල්ලේරියාව හා මාලඹේ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.10.21 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 800 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – යක්කල පොලිස් ස්ථානය.**

2024.10.21 වන දින රාත්‍රී කාලයේ යක්කල පොලිස් වසමේ යක්කල නගරයේදී නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර

**හෙරොයින් ග්‍රෑම් 09 මිලි ග්‍රෑම් 320 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන උතුවම් බෝගහවත්ත, වේයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

යක්කල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. වන අලි පහරදීමකින් පුද්ගලයෙකු මිය යාම - තිරුක්කෝවිල් පොලිස් වසම.

2024.10.21 වන දින අළුයම් කාලයේ තිරුක්කෝවිල් පොලිස් වසමේ තංගවේලායුදපුරම් ප්‍රදේශයේදී වන සතුන්ගෙන් වගාබිම ආරක්‍ෂා කිරීමට ගොස් සිටියදී පැමිණි වන අලියෙකුගේ පහර දීමකින් පුද්ගලයෙකු මියගොස් ඇති බවට තිරුක්කෝවිල් පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 64 ක් වූ ගයාත්‍රී ග්‍රාමය, තිරුක්කෝවිල් 04 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තම බිරිඳ සමඟ වගා භූමියට ගොස් සිටියදී මෙම අනතුරට ලක්ව ඇත. මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්‍ෂණ පවත්වා ඥාතීන්ට භාර දී ඇත. තිරුක්කෝවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - කහවත්ත පොලිස් වසම.

2024.10.21 වන දින උදෑසන කාලයේ කහවත්ත පොලිස් වසමේ පැල්මඩුල්ල නෝනාගම මාර්ගයේ වැල්ලදුර ප්‍රදේශයේදී කහවත්ත දෙස සිට මාදම්පේ දෙසට ධාවනය කල යතුරුපැදියක් වැසි සහිත කාලගුණය හේතුවෙන් පැදිකරුට යතුරුපැදිය පාලනය කර ගැනීමට හොහැකිව මාර්ගයේ ලිස්සා ගොස් පෙරලී ඉදිරියෙන් පැමිණි කුඩා ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු බරපතල තුවාල ලබා කහවත්ත මූලික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ සඳුන්ගම, බලන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්‍ෂණය සිදුකර ඥාතීන්ට භාර දී ඇත. කුඩා ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කහවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - වෙන්නප්පුව පොලිස් වසම.

2024.10.21 වන දින උදෑසන කාලයේ වෙන්නප්පුව පොලිස් වසමේ හලාවත කොළඹ මාර්ගයේ කොළින්ජාඩිය ප්‍රදේශයේදී කොළඹ දෙස සිට හලාවත දෙසට ධාවනය කල ලොරි රථයක් මාර්ගය හරහා ගමන් කල යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු බරපතල තුවාල ලබා මාරවිල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 75 ක් වූ පෙරේරා මාවත, වෙන්නප්පුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාරවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර වෙන්නප්පුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - තිරුක්කෝවිල් පොලිස් වසම.

2024.10.21 වන දින සවස් කාලයේ තිරුක්කෝවිල් පොලිස් වසමේ අක්කරපත්තුව පොතුවිල් මාර්ගයේ තම්බැට්ට පෙරිය ප්‍රදේශයේදී අක්කරපත්තුව දෙස සිට පොතුවිල් දෙසට ධාවනය වූ යතුරුපැදියක් පසු පැදිකරුවන් දෙදෙනෙකු සමඟින් ගමන් කරමින් සිටියදී පැදිකරුට යතුරුපැදියේ වේගය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ වම් පසට ඇදීගෙන ගොස් මොහොත්තුවාරම් පාලමේ ආරක්ෂිත වැටේ ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් පැදිකරු හා පසු පැදිකරුවන් දෙදෙනා බරපතල තුවාල ලබා තිරුක්කෝවිල් රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව පැදිකරු හා පසු පැදිකුරුවෙකු වැඩිදුර ප්‍රතිකාර සඳහා අක්කරපත්තුව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ විනයාගපුරම් 03 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අක්කරපත්තුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තිරුක්කෝවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**